ත්? රෝගපීඩිතපුරුෂතෙම; අභිවසසෙන් මෙනම්දෙයක් කි
යන්නේය; එඹාපින්වතුන්, මීටපළමුවෙන් මම රෝගපීඩානු
තුව; ගොයිතැන් වෙළඳාම්ආදිවූ සියළුකර්මාන්තකෙළෙමි;
ඒ මම බලවත්වූ ලෙඩට දුකට පැමිණියෙමි; මාගේ මලමූත්‍ර
ඇගතැවරී මැසිකැලම් සිටිනෙමි; එඹාපින්වතුනි, ලෙඩින්
දුකින් නොමිදුනුනිසා මෙබඳුදුකට පැමිණියෙම්; මම පම
ණක් ලෙඩින්දුකින් නොමිදුනෙත් නොවෙමි; තොපිත් නො
මිදුනේය; එහෙයින් ලෙඩදුක් එන්ඩපළමුව පින්කරගනුවයි
කියන්නාක් මෙන් වැටහෙනහෙයින් දෙවදූතයයි දතයුතු)
සමනුගාහිත්වා, කාරණාවිචාරා; සමනුභාසිත්වා, භයගන්වා; ච
තුත්‍ථං දෙවදූතං, සතරවැනි දෙවදූතයා; සමනුයුජති, යොදා
ආරොපනයකොට ලබ්ධිය විචාරන්නේය; සමනුගාහති, කා
රණ විචාරන්නේය; සමණුභාසති, භයගන්වන්නේය; අ
ම්භොපුරිස, එඹා පුරුෂය; ත්වං, තෝ; මනුස්සෙසු, මනුෂ්‍යය
න් අතුරෙහි; පාතුභූතං, පහළවූ;? චතුත්‍ථං දෙවදූතං, සතර
වැනි දෙවදූතයා; නාද්දසාති, නුදුටුයෙහිදැයි (විචාරන්නේය;)
සො, හෙතෙම; එව මාහ, මෙසේ කියන්නේය; භන්ත, ව
හන්ස, නාද්දසන්ති, නුදුටිමි කියන්නේය; භික්ඛවෙ, මහණෙ
නි, තමෙනං, ඕහට; යමොරාජා, (ධාර්මිෂ්ඨවූ) යමරජතෙම; එ
වමාහ, මෙසේ කියන්නේය; අම්භොපුරිස, එඹා නවත්පුරුෂය;
මනුස්සෙසු, මනුෂ්‍යයන් අතුරෙහි; රාජානො, රජදරුවෝ;
ආගුචාරිං චොරං ගහෙත්වා, මහත්අපරාධකළ සොරුන්අල්වා
ගෙණ; විවිධාකම්මකරණා කාරෙන්ත, නොයෙක් කම්කටු
ළු කරන්නාහුය; කසාහිපිතාලෙන්ත, කසවලින් තලන්නාවූද;
වෙත්තෙහි පිතාලෙන්ත, වේවැල්වලින් තලන්නාවූද; අඩ්ඪද
ණ්ඩකෙහි පිතාලෙන්ත,දෙරියනක්දිගඇති මුගුරුවලින් තලන්
නාවූද; හත්‍ථම්පිඡින්දන්ත, අතකපන්නාවූද;පාදම්පි ඡින්දන්ත,
පය කපන්නාවූද; හත්‍ථපාදම්පි ඡින්දන්ත, අතපයදෙකම කප
න්නාවූද; කණ්ණම්පි ඡින්දන්ත, කන කපන්නාවූද; නාසම්පි
ඡින්දන්ත, නාසයකපන්නාවූද; කණ්ණනාසම්පි ඡින්දන්ත, කන
න් නාසා කපන්නාවූද; බිලඟථාලි කම්පිකරෙන්ත, බොලල
උගුළුවා කාඩිඋතුරුකොට වත්කරන්නාවූද; (නොහොත් රත්
කළ යගුලිබහන්නාවූද;) සංඛමුණ්ඩි කම්පිකරොන්ත, ඉසබොර
එලා සක්පතක්සේ කරන්නාවූද; රාහුමුඛම්පි කරොන්ත,
මුඛයෙහි තෙල්රෙදි බහා ගිනිදල්වන්නාවූද;නොහොත් ලේ

වගුරුව වගුරුවා දෙකන්සිළුදක්වා මුඛයපලුන්නාවූද; ජෝතිමාලිකම්පි කරොන්තෙ, සියළු ශරීරයෙහි තෙල්රෙදිවෙලා ගිනි දල්වන්නාවූද; හත්ථපජ්ජෝතිකම්පි කරොන්තෙ, අත තෙල්රෙදි වෙලා ගිනි දල්වන්නාවූද; එරකවත්තිකම්පිකරොන්තෙ, ඉගෙනිපටන් සමගලවා; (වැරගැලිකොට ඉරා යොතින් බැඳ තලතලා පත්වමින් ඔහුගේ සම පාගවා වැටෙන්ම හරින්නාවූද) චීරකවාසිකම්පිකරොන්තෙ,(ගල සරපටින් සම උගුළුවා ඉහෙනිතබා ඉගෙනි පටන් සම උගුළුවා කෙඩෙනි තබා උපරි චම්මයෙන් හෙළපිම චම්මය වසා හෙටසීම චම්මයෙන් උපරිම චම්මය වසා වැහැර)සිවුර පෙරවූවාක්මෙන් කරවන්නාවූද; එණෙය්‍යකම්පි කරොන්තෙ, දෙදන දෙවැලම්ට යවුල් ගසා වටකොට ගිනි දල්වන්නාවූද; බලිසමංසිකම්පි කරොන්තෙ, උභතො මුඛ ඇති බිලිය පැහැර ඇගමස් කඩන්නාවූද; කහාපණකම්පි කරොන්තෙ, සියළු ශරීරය කහවණුවක් සේ කපාහරින්නාවූද; ඛාරාපතච්ඡිකම්පි කරොන්තෙ, (සියළු ශරීරය කෙත්‍රී හෙලා කොසෙසන්) ක්‍ෂාරවූ කාරන් ගල්වා මස්දියකර හරින්නාවූද, පලිඝ පරිවත්තකම්පි කරොන්තෙ,(ඇලයකින් බිමහොවා කණෙහි යවුලක්ගසා දෙය කුල අල්වාගෙණ චක්‍රමඬලය හෙලනුවන්සෙයින්) වට කරකවන්නාවූද; පලාලපීඨකම්පි කරොන්තෙ, ඇගඇට තලා (පිදුරුබිසසක්සේ)හකුළුවා දමන්නාවූද; තමෙනනාපි තෙලෙන ඔසුවනෙන, කකියවනතෙල් ඇග ඉස්නාවූද; සුනඛෙහිපි ඛාදාපෙනොන, ජානසුනඛයන්ලවා කවන්නාවූද; ජීවන්තම්පි සූලෙ, උත්තාසෙන්තෙ,දිවස්උලෙඉඳුවන්නාවූද; අසිනාපිසීසං ඡින්දන්තෙනි, කඩුවෙන් ඉස කපාදමන්නාවූද සොරුන්; තං, නො; නාද්දසාති, නුදුටුයෙහිදැයි විචාරන්නේය; සො, හෙතෙම; එවමාහ මෙසේ කියන්නේය; භන්තෙ, වහන්ස; අද්දසන්ති, දුටිම්කියන්නේය; සිාඛමෙ, මහණෙනි; තමෙනං, ඔහට; යමොරාජා, ධාර්මිෂ්ටවූ යමරජතෙම; එවමාහ, මෙසේ කියන්නේය; අම්භොපුරිස, එම්බා භවත්පුරුෂය; විඤ්ඤුස්සසතො, කාරණ කාරණදන්නාවූ; මහල්ලකස්ස, මහළුවූ; තස්සතෙ, ඒ තට; අහං ඛො, මම වනාහි; නො, භවත්නී; යෙකිර, යම්කෙනෙක් වනාහි; පාපානි කම්මානි කරොන්ති, පවුකම් කෙරෙද්; තෙ, එසත්වයෝ; දිට්ඨෙවධම්මෙ, ඉහාත්මභාවයෙහිම; එවරූපා, මෙබඳුවූ; විවිධාකම්මකරණා කාරයන්ති, අනේකප්‍රකාර කම්කටුළු කරණු ලබන්නාහුය; පරත්‍ථ, පරලොව; කිමඩග පන, කියයුතු කිම්ද; ගඬ, එබැවින්; අහං, මම;

කායෙනවාචාය මනසා, කයින් වචසින් මනසින්, කල්‍යාණං කරෙමීති, යහපතක් කරමියි කියා, න එතදහොසි, නොසිතුණේදැයි විචාරන්නේය; සො, හෙතෙම; එවමාහ, මෙසේකියන්නේය; භණෙත, වහන්ස; නාසක්ඛිංසං, නොපිළිවන්වීමි; භණෙත, වහන්ස; පමාදස්සන්ති, පමාවීම්කියන්නේය; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඕහට; යමොරාජා, යමරජතෙම; එවමාහ, මෙසේකියන්නේය; අම්භොපුරිස, එම්බාභවත්රුෂය; පමාදවතාය, පමාව කරණකොටගෙණ; තග්ඝ, ඒකාන්තයෙන්; ත්වං, තෝ; කායෙනවාචාය මනසා, කයින් වචසින් මනසින්; න කල්‍යාණමකාසි, කුසල් නොකළෙහිය; අම්භොපුරිස, එම්බාභවත්පුරුෂය; යථාතංපමත්තං, යම්ප්‍රකාරයකින් පමාවූනට; තථාකරිස්සන්ති, ඒප්‍රකාරයෙන් තාඩනපීඩන වධබන්ධනකරන්නාහුය; තංඛොපන පාපංකම්මං, එපාපකර්මයතෙම; නෙවමාතරාකතං, මෑණියන්විසින් නොකරණලද්දීය; නපිතරාකතං, පියානන්විසින් නොකරණලද්දේය; න භාතරාකතං, භ්‍රාතෘන්විසින් නොකරණලද්දේය; න භගිනියාකතං, බුහුනනියන්විසින් නොකරණලද්දීය; නමිත්තාමච්චෙහිකතං, මිත්‍රාමාත්‍යයන්විසින් නොකරණලද්දේය; නඤාතිසාලොහිතෙහිකතං, ඇවැස්සනෑයන්විසින් නොකරණලද්දේය; නසමණබ්‍රාහ්මණෙහිකතං, ශ්‍රමණබ්‍රාහමණයන්විසින් නොකරණලද්දේය; නදෙවතාහිකතං, දෙවියන්විසින් නොකරණලද්දේය; තයාකතං, තාවිසින් කරණලද්දේය; එතස්සවිපාකං, ඒ පාපකර්මයාගේ විපාකය; ත්වංයෙව, තෝම; පටිසංවෙදිස්සසීති, විඳින්නේයයි කියන්නේය—භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඕහට යමොරාජා, (යමලෝකාධිපති) යමරජතෙම; චතුත්ථං දෙවදූතං, සතරවැනි දෙවදූතයා; සමනුයුඤ්ජිත්වා, යොදා අරෝපනයකොට ලබ්ධියවිචාරා; (මෙහි දක්වනලද සතරවැනි දෙවදූතයයි කියනලද දෙතිසක්කම්කාවූ කුමන්කියා කුමක්ප්‍රකාශකොට දෙවදූතවීදයත්? දෙතිස්කම් කටවූ අර්ථවශයෙන් මෙනම්දෙයක් කියන්නේය,එම්බා භවත්නි; අපි වෘෂණාවිනාදියෙන් නූපදුමහ; නොපවැතිවූන්ගේ ශරීරයෙහි උපදුමහ; අපිඋපදින්ව පළමුකොට පින්කරගණුවයි කියනාක්මෙන් වැටහෙන්නේවේද එසේහෙයින් සතරවැනි දේවදූතවීයයි දතයුතු)—සමනුගාහිත්වා, කාරණවිචාරා; සමනුභාසිත්වා, භයගන්වා; පඤ්චමං දෙවදූතං, පස්වැනිදෙවදූතයා; සමනුයුඤ්ජති, යොදා අරොපනයකොට ලබ්ධියවිචාරන්නේය; සමනුගාහති, කාරණාවිචාරන්නේය—සමනු

භාසති, භයගත්වන්නේය; අම්භෝපුරිස, එම්බාභවත්පුරුෂය, ත්වං, තෝ; මනුස්සෙසු, මනුෂ්‍යයන්අතුරෙහි; පාතුභූතං, පහළවූ; පඨමං දෙවදූතං, පස්වැනි දෙවදූතයා; නාද්දසාසි, නුදුටුවූයෙහිදැයි විචාරන්නේය සො, හෙතෙම; එවමාහ, මෙසේකියන්නේය, භන්තෙ, වහන්ස; නාද්දසන්ති, නුදුටිමි කියන්නේය; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහට; යමොරාජා, යමරජතෙම; එවමාහ, මෙසේකියන්නේය; අම්භෝපුරිස, එම්බාභවත්පුරුෂය; මනුස්සෙසු, මනුෂ්‍යයන් අතුරෙහි; එකාහමතංවා, මරණටපැමිණ එක්දවසක්ගියාවූහෝ; විහමතංවා, මරණටපැමිණ දෙදවසක්ගියාවූහෝ; තීහමතංවා, මල තුන්දවසක්ගියාවූහෝ, උද්ධුමාතකංවා, පිරුණුභස්ත්‍රාවක්සෙයින් යථාක්‍රමයෙන් ඉදිමීගියාවූහෝ; විනීලකංවා, නිල්වූහෝ; විපුබ්බකජාතංවා, නවවාරයෙන්-පූයාවෑහෙනයහෙයින් විපුබ්බකවූ; ඉත්ථිංවා, පුරිසංවා ස්ත්‍රියකුහෝ; පුරුෂයකුහෝ; ත්වං, තෝ; නාද්දසාසි, නුදුටුවූයෙහිදැයි විචාරන්නේය; සො, හෙතෙම; එව මාහ, මෙසේකියන්නේය; භන්තෙ, වහන්ස, අද්දසන්ති, දුටිමි කියන්නේය; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහට; යමොරාජා, යමරජතෙම; එවමාහ, මෙසේකියන්නේය; අම්භෝපුරිස, එම්බාභවත්පුරුෂය; විඤ්ඤුස්සසතො, කාරණාකාරණ දන්නාවූ; මහල්ලකස්ස, මහළුවූ; තස්සතෙ, ඒතට; අහංඛො; මමවනාහි; මරණධම්මොඅම්හි, මරණය ස්වභාවකොටඇත්තෙමි; මරණං අනතීතො, මරණ අතික්‍රාන්තනොකෙළෙමි; හන්ද, එබැවින්; අහං, මම; කායෙනවාචායමනසා, කයින් වචසින්මනසින්; කල්‍යාණංකරොමීති, යහපතක්කරමිකියා; න එතදහොසි, නොසිතුනේදැයි විචාරන්නේය; සො, හෙතෙම; එවමාහ, මෙසේකියන්නේය; භන්තෙ, වහන්ස; නාසක්ඛිස්සං, නොපිළිවන්වීමි; භන්තෙ, වහන්ස; පමාදස්සන්ති, පමාවීමියි කියන්නේය; භික්ඛවෙ, මහණෙනි; තමෙනං, ඔහට; යමොරාජා, යමරජතෙම; එවමාහ, මෙසේකියන්නේය; අම්භෝපුරිස, එම්බාභවත්පුරුෂය; පමාදවතාය, පමාවාසය කරණකොටගෙන; තග්ඝ, ඒකාන්තයෙන්; ත්වං, තෝ; කායෙනවාචායමනසා, කයින් වචසින් මනසින්; නකල්‍යාණමකාසි, යහපතක්නොකළෙහිය; අම්භෝපුරිස, එම්බාපුරුෂය; යථාතං පමත්තං, යම්ප්‍රකාරයකින් පමාවූහට; තථාකරිස්සන්ති, ඒප්‍රකාරයෙන් තාඩන පීඩන වධබන්ධනකරණාහුය; එතංපාපං ඛොපන, ඒපාපකම්මතෙමවනාහි. නෙවමාතරාකතං, මවිසින් නොකරණලද්දීය; නපිතරාකතං, පියානන්විසින් නොක

ණිලද්දේය; නභාතරකතං, භ්‍රාතෲවිසින් නොකරණලද්
දේය; නභගිනියාකතං, බුහුණනියන්විසින් නොකරණලද්
දේය; නමිත්තාමච්චෙහිකතං, මිත්‍රාමාත්‍යයන්විසින් නොකරණ
ලද්දේය; නඤාතිසාලොහිතෙහිකතං, ඇවැසසබනධූන්විසි
න් නොකරණලද්දේය; නසමණබ්‍රාහමණෙහිකතං, ශ්‍රමණ
බ්‍රාහමණයන්විසින් නොකරණලද්දේය; නදෙවතාහිකතං,
දෙවියන්විසින් නොකරණලද්දේය; එතංපාපංකම්මං, ඒපාප
කර්මයතෙම; තයාකතං, තාවිසින් කරණලද්දේය; එතස්සවි
පාකං, ඒපාපකර්මයාගේ විපාකය; ත්වමෙව, තෝම; පටිසංවෙ
දිස්සසීති, විඳින්නේයයි කියන්නේය—හිකඛවෙ, මහණෙනි;
පඨමං, දෙවදූතං, පස්වැනිදෙවදූතයා; සමනුයුඤ්ජිත්වා, යොදා
අරෙපණයකොට ලබ්ධියවිචාරා; (මෙහිදක්වනලද පස්වැනි
දෙවදූතයයි කියනලද; මෘතශරීරයතෙම කුමක්කියා කුමක්
ප්‍රකාශකොට දෙවදූතවීදයත්? මලශරීරයතෙම.අජීවසයෙන්
මෙනම්දෙයක් කියන්නේය; එඹාපින්වත්නි, ඉදිම්මටගියාවූ
නිල්වගියාවූ, නවවාරයෙන් වෑහෙන සැරවඇත්තාවූ; වඩුව
න්විසින් දමනලද වැඩනැති ලීයක්සෙයින් අනාථ අසරණව
දමනලදාවූ මා බලව් මරණින් නොමිදුනනිසා මෙසේවීම්
තොපිත් මරණින් නොමිදුනේය මරණඑනතට පළමුව පින්
කරගණුවයි කියනනාක්මෙන් වැටහෙණහෙයින් මලරුව දෙ
වදූත වියයි දතයුතු)සමනුගාහිත්වා, කාරණාවිචාරා; සමනුභා
සිත්වා, භයගන්වා,තුණ්හිහොති,(අහො මේතෙම නරකදුක්වි
ඳින්නේයයි කියා මහත්සොකයට පැමිණ) තුෂ්ණීම්භූත වන්
නේය–මේ පඤ්චදෙවතා විනිශ්චය කාවරෙක්ලබාද කාවරෙක්
නොලබාද යතහොත්? යමෙක්විසින් බොහෝ පවුකරණලද්
දේද, හෙතෙම කිංචමානවිකාව සුප්‍රබුඩ දෙවදත්ත නන්දමා
නවක නන්දයක්ෂයාමෙන්අපායෙහිඋපදින්නේය;යමෙක්හුවිසින්
බොහෝ පින්කරණලද්දේද, හෙතෙම දුට්ඨගැමුණුරජ්ජුරුවන්
මෙන්ද සූළුගල උපාසකමෙන්ද දෙව්ලොවඋපදනේය; යමෙක්
හුවිසින් කුසල්අකුසල් මිශ්‍රකොට කරණලදද හෙතෙම විනිශ්ච
යට පැමිණෙන්නේය එයටඋපමා මෙසේයි; බඩුසහිත සොරා
ඇල්එකල්හි කැමැත්තක් කරන්නේය–බඩුනැතුව සොරාඇල්
එකල්හි විනිශ්චයට පැමිණෙන්නේය මේ කාරණාවත්එසේමැ
යි–ස්වල්ප කුසල් කළෝ තමාගේ ධර්මතාවෙන් කළකුසල් සිහි
කරන්නේය; සිහිය, කරවූකල්හි ( සිහියලබති ) දීඝජන්ත
දෙමලතෙම තමාගේධර්මතාවෙන් කළකුසල් සිහිකළේය
ඒ දීඝජන්ත දෙමලතෙම පරමසුන්දර සුමනගිරි වෙහෙර

ආකාශචෛත්‍යයට රතුවස්ත්‍රයක් පූජාකළේය; හෙතෙම මැ
තාභාගයෙහි කුසල් අකුසල් මිශ්‍රහෙයින් උස්සදනරකය සමී
පයෙහි උපන්නේය නරක ජ්වාලාශබ්දයඅසා භයපත්ව ත
මා ආකාශචෛත්‍යයට පූජාකළ වස්ත්‍රයසිහිකොට ඒ අත්බෑ
වින් අන්තරහිතව තුන්ගව්වුළස ශරීරඇතිව ගව්වුළස මිණිඔටු
නුදුරු සැටනැලක් පූරාලන ආභරණපැළඳ දිවසරන් පිරිවරා
දිව්විමනෙක උපන්නේය; තවද එක්තරා උපාසකයෙක් තමා
ගේ පුතුවූ ළදරුභික්ෂුකෙනෙකුන්ට වස්ත්‍රයක් පූජාකළේය
හෙතෙම කුසල් අකුසල් මිශ්‍රහෙයින් උස්සදනරක සමීප
යෙහි උපන්නේය; නරකයෙහි වහ්ණිජ්වාලාශබ්දය අසා භ
යපත්ව තමා ළදරුභික්ෂුන්වහන්සේට පූජාකළ වස්ත්‍රය සිහි
කොට එයින්අන්තරහිතව සැටගව්වුළස මිණිඔටුනුදුරු සැට
ගැලක් පූරාලන දිවආභරණපැළඳ දිවසරන්පිරිවරා දෙව්විම
නෙක උපන්නේය—මෙසේ තමාකළකුසල් සිහිකොට දෙ
ව්ලොව උපදනාහ තමා සිහිනොකරණකල්හි දෙවදූතයන්
විචාරති—එහි සමහරකෙනෙක් පළමුවන දේවදූතයා විචා
රණකල සිහියලබති සමහරකෙනෙක් දෙවෙනි තුන්වෙනි
සතරවෙනි පස්වෙනි දේවදූතයන් විචාලකල්හි සිහියලබති
එසේත් සිහිනොවන්නේනම් යමරජ දිවසින් බලා සිහික
රවන්නේය අනුරාධපුර එක්අමාත්‍යයෙක් රුවන්වැලිසෑයට
පිච්චමල්පූජා යමරජහට පින්දුන්නේය හෙතෙම කුසල් අකු
සල් මිශ්‍රවකළහෙයින් ඔසුපත්නරක සමීපයෙහි උපන්නේය;
ජ්වාලාශබ්දයඅසා භයපත්වූයේ දෙවෙනි තුන්වෙනි හතර
වෙනි පස්වෙනි දෙවදූතයන් විචාලකල කුසල් සිහිනොක
ළේය, එකල යමරජ දිවසින්බලා කළ කුසල්දැක එඹල තෝ
රුවන්වැලිසෑයට පිච්චමල්පූජා මටපින්දුන්නේ නොවේදැයිකි
යා කළකුසල් සිහිකරවීය; හේකුසල් සිහිකොට තිදෑපිබිදියකු
පරිද්දෙන් දෙව්කතුන් පිරිවරා දෙව්ලොව උපන්නේය-යම
රජ දිවසින්බලා කළකුසල් නොදැක අහෝමෙතෙම තද
කුරිරුදුක් අනුභවකරන්නේයයි කියා මහත් සෝකදුකටපැමි
ණ තුෂ්ණිම්භූත වන්නේය—

භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙ
නං, ඕහට; පඤ්චවිධබන්ධනංනාම, පඤ්චවිධබන්ධනනම්වූ වධ
යන්; කාරෙන්ති, කරවන්නාහු, තත්තං අයොඛීලං, රත්වූ
නාගඹනල්කඳසා යකඩඋලක්; හත්ථෙගමෙන්ති, දකුණුඅත
ගසා බාන්නාහුය; තත්තංඅයොඛීලං, රත්වූ නාගඹනල්කඳ
සා යකඩඋලක්; දුතියෙහත්ථෙ ගමෙන්ති, දෙවෙනි අත

ගසන්නාහුය; තත්තං අයොඛීලං, රත්වූ යකඩඋලක්, පාදෙ
ගමෙන්ති, පයගසා බාන්නාහුය; තත්තං අයොඛීලං, රත්වූ
යකඩඋලක්; දුතියෙපාදෙගමෙන්ති, දෙවෙනිපය ගසන්නා
හුය; තත්තං අයොඛීලං, රත්වූයකඩඋලක්, මජ්ඣෙඋරස්මිං
ගමෙන්ති; හෘදයමධ්‍යයෙහි ගසාබහන්නාහුය; සො, හෙතෙ
ම; තත්ථ, එහි; තිප්පා, තීක්ෂණවූ' කටුකා, කර්කශවූ; දුක්ඛා
වෙදනා, නරක දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳින්නේය;
යාව, යම්තාක්කල්; තංපාපංකම්මං, ඒපාපකර්මය; නව්‍යන්ති
හොති, කෙළවරනොවේද; තාව, ඒතාක්කල්, නවකාලංක
රෙන්ති, කාලක්‍රියානොකරන්නේය—භික්ඛවෙ, මහණෙනි, නි
රයපාලා, නරකපාලයෝ; තමෙනං, නරකගතසත්වයා, සං
වෙසෙත්වා (තුන්ගව්වුපමණ ශරීරඇති නිරිසතුන් ගිනිගත්
යපොළව)හෙලා කුඨාරීහි, එක්පලයක්පමණ කුඨාරීන්; තච්ඡ
න්ති, අෂ්ටාංශ සොඩසාංශකොට සස්නාහුය; භික්ඛවෙ, මහ
ණෙනි; නිරයපාලා, යමපල්ලෝ; තමෙනං, ඔහු; උද්ධපාදං
අධොසිරං, ඨපෙත්වා, ඌර්ධ්වපාද අධොශීර්ෂකොට; වාසීහි,
ගිනිගෙණදිලියෙන කුළුපමණ වෑවලින්; තච්ඡන්ති, සුඹු
ලෙලිපමත් ඇටදක්වා සෙමින් සෙමින් සස්නාහුය; සො,
හෙතෙම; තත්ථ, එහි, තිප්පා, තීක්ෂණවූ; කටුකා, කර්කශවූ;
වෙදනා, නරකවේදනාවන්; වෙදෙති, විඳිනේය; යාව, යම්
තාක්කල්; තංපාපංකම්මං, ඒපාපකර්මය; නව්‍යන්තිහොති;
කෙළවරනොවේද; තාව, ඒතාක්කල්; නවකාලංකරෙන්ති,
කාලක්‍රියානොකරන්නේය—භික්ඛවෙ, මහණෙනි; නිරයපා
ලා, නරකපාලයෝ; තමෙනං, නරකගතසත්වයා, රථෙයො
ජෙත්වා,(සර්වප්‍රකාරයෙන් දිලිහෙන්නාවූ) රථයෙහියොදා; ආදි
ත්තාය, ගිනිගෙණඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතාය, ප්‍රකෂ්ඨයෙ
න් දිලියෙන්නාවූ; සජොතිභූතාය; ගිනිදැල්සහිතවූ; පඨවියා,
ගිනිගත් යපොළව; සාරෙන්තිපි, ඇවිදුවන්නාහුය; පච්චාසා
රෙන්තිපි,ගිනිගත්යපොළව නැවතනැවත ඇවිදුවන්නාහුය;
භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙ
නං, නරකගතසත්වයා; ආදිත්තං, ගිනිගෙණඇවිලෙන්නාවූ;
සම්පජ්ජලිතං, සර්වප්‍රකාරයෙන් දිලියෙන්නාවූ; සජොතිභූතං,
ගිනිදැල්සහිතවූ; මහන්තං, මහත්වූ, අඞ්ගාරපබ්බතං, අඟුරු
පර්වතයට; ආරොපෙන්තිපි, යමුගුරෙන්පැහැර නඟන්නාහුය;
ඔරොපෙන්තිපි, යමුගුරෙන්ගසා බාන්නාහුය—භික්ඛවෙ, මහ
ණෙනි, නිරයපාලා, නරකපාලයෝ; තමෙනං, නරකගත
සත්වයා, උද්ධපාදං අධොසිරං ගහෙත්වා, ඌර්ධ්වපාද අධශ්ශිරස්

කොට; ආදිත්තාය, ගිනිගෙණ ඇවිලෙන්නාවූ; සම්පජ්ජලි
තාය, ප්‍රකෂීයෙන් දිලියෙන්නාවූ; සජොතිභූතාය, ගිනිදැල්
සහිතවූ; ලොහකුම්භියං,(කක්යනලද)ලොහොකුම්භනරකයෙ
හි; පක්ඛිපන්ති, බහන්නාහුය; සො, හෙතෙම; චෙතුදෙදහ
කං, පෙණපිඩුබඳු වූ ශරීරය; පච්චමානො, පැසෙන්නේ;
සකිම්පි, එකවරෙක; උද්ධංගච්ඡති, උඩටයන්නේය; සකිම්පි,
එක්වරෙක; අධොගච්ඡති, යටටයන්නේය; සකිම්පි, එක්වරෙ
ක; තිරියංගච්ඡති, සරසට යන්නේය; සො, හෙතෙම; තත්ථ
එහි; තිප්පා, තීක්ෂණවූ; කටුකා, කර්කශවූ; දුක්ඛාවෙදනා,දුඃඛ
වෙදනාවන්; වෙදෙති, විඳින්නේය; යාව, යම්තාක්; තංපා
පංකම්මං, ඒපාපකර්මය; නව්‍යන්ති, හොති, කෙළවරනොවේ
ද; තාව, එතාක්කල්; නවකාලංකරොති, කාලක්‍රියා නොක
රන්නේය—භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාල
යෝ; තමෙනං,, නරකගතසත්වයා; මහානිරයෙ, අවීචිමහ
නරකයෙහි; පක්ඛිපන්ති ,ප්‍රක්ෂෙපකරන්නාහුය; භික්ඛවෙ, ම
හණෙනි; සොඛොපන මහානිරයො, ඒ අවීචිමහනරකය ච
නාහි-(මේ අවීචිනරකය ආයාමවිස්තරයෙන්ද; අභ්‍යන්තර
ය, සියක්යොදුන ලොහොපොලොවද ලොහොවියනද; එකි
එකිභිත්තක්ද නවනවයොදුන්ඝනය; එහ පූර්වභිත්තියෙන් අග්ණි
ජ්වාලා උපදිනව පශ්චිමභිත්තිය පැහැර විනිවිද එයින් පිටත
සියක්යොදුන් තැන් පැතිරසිට තුබුනුත්දිශාවෙහිද උඩද යට
ද ජ්වාලා එමනියායෙන්ම පවත්නේය මෙසේ ජ්වාලාන්තර
යෙන් අවීචිය තුන්සිය අටලොස් යොදුන වට නවසියසූපණ
ස්යොදුන උසසද සමග දසදහසක් යොදුන්යයි දතයුතු;

චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසොමිතො
අයොපාකාර පරියන්තො, අයසාපටිකුජ්ජිතො
තස්ස අයොමයා භූමි ජලිතා තෙජසායුතා
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා.

චතුක්කණ්ණො, නගණලද චතුස්කර්ණයක් ඇත්තේ
ය; චතුද්වාරො, ප්‍රථුලතර චතුර්වාරයක්ඇත්තේය; විභත්තො,
කොට්ඨාස වශයෙන්, විභාග කරණ ලද්දේය; භාගසොමි
තො, කොට්ඨාස වසයෙන් ප්‍රමාණ කරණලද්දේය; අයො
පාකාර පරියන්තො, නවයොදුන් අයඃප්‍රකාරයෙන් කෙළව
රකොට ඇත්තේය; අයසා පටි කුජ්ජිතො, නවයොදුන්
යපියනකින් වසනලද්දේය; තස්ස භූමි, අවීචිමහා නරක
යෙහි ප්‍රථුවිය; අයොමයා, අයඃමය වන්නීය; ජලිතා, දිලි
යෙන්නාවූ; තෙජසා යුතා; වහ්නි තෙජසින් යුක්තවූ; සම

නතා, හාත්පසින්; යොජනසතං, යොදුන් සියයක්, සබ්බද, හැමකල්හි; ඵරිත්වා තිට්ඨති, ගිණිජ්වාලාපැතිර සිටින්නීය; භික්ඛවෙ, මහණෙනි; තස්ස මහානිරයස්ස ඛො පන, ඒ අවීචිමහ නරකයෙහි වනාහි; පුරත්ථිමාය භිත්තියා, පූර්ව භිත්තින්; අච්චි උට්ඨහිත්වා, අග්නිය නැගී; පච්ඡිමාය භිත්තියා, පශ්චිම භිත්තියෙහි; පටිහඤ්ඤති, වැදගන්නේය; පච්ඡිමාය භිත්තියා, පශ්චිම භිත්තියෙන්; අච්චි උට්ඨහිත්වා, අග්නිය නැගී; පුරත්ථිමාය භිත්තියා, පූර්ව භිත්තියෙහි; පටිහඤ්ඤති, වැදගන්නේය; උත්තරාය භිත්තියා, උතුරු භිත්තින්; අච්චි උට්ඨහිත්වා, වග්නිය නැගී; දක්ඛිණාය භිත්තියා, දකුණු භිත්තියෙහි; පටිහඤ්ඤති, වැදගන්නේය; දක්ඛිණාය භිත්තියා, දකුණු භිත්තියෙන්; අච්චි උට්ඨහිත්වා, වග්නිය නැගී, උත්තරාය භිත්තියා, උතුරුභිත්තියෙහි; පටිහඤ්ඤති, වැදගන්නේය; හෙට්ඨිමාය අච්චි උට්ඨහිත්වා, හෙට්ඨිමදිශාභාගයෙන් ගිනිවැද; උපරිපටිහඤ්ඤති, උපරිමපච්ඡදනෙහි වැදගන්නේය; උපරිතො අච්චි උට්ඨහිත්වා, උපරිම දිශාභාගයෙන් ගිනි නැගී; හෙට්ඨිමාය පටිහඤ්ඤති, යට වැදගන්නේය; සො, හෙතෙම; තත්‍ථ, එහි; තිප්පා, තීක්ෂණවූ; කටුකා, කර්කශවූ; දුක්ඛාවෙදනා, දුඃඛවෙදනාවන්, වෙදෙති, විඳින්නේය; යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; න ව්‍යන්ති හොති, කෙළවර නොවේද; තාව, එතාක්කල්; නච කාලංකරොති, කාලක්‍රියා නොකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; කදාචි කරහචි, කිසිකාලෙක්හි; දීඝස්ස අද්ධුනො අච්චයෙන, දීඝකාලයක්හුගේ ඇවෑමෙන්; තස්ස මහානිරයස්ස, ඒ මහනරකයාගේ; පුරත්ථිමං ද්වාරං, පූර්ව වාරය; අවාපුරීයති, විවෘතවන්නේය; හෙවත් ඇරෙන්නේය; හොති ඛො සමයො, මෙබඳුකලක් ඇත්තේය; සො, හෙතෙම; සීඝෙන ජවෙනධාවති, සීඝ්‍රවූ ජවයෙන්ම දුවන්නේය; සීඝෙනජවෙන ධාවතො, සීඝ්‍රජවයෙන් දුවන්නාවූ; තස්ස, ඔහුගේ; ඡවිම්පි ඩය්හති, සිවියද දවන්නේය; චම්මම්පි ඩය්හති, සමද දවන්නේය; මංසම්පි ඩය්හති, මස්ද දවන්නේය; නහාරුම්පි ඩය්හති, නහරද දවන්නේය; අට්ඨීනිපිසම්පධූපායන්ති, ඇටද ඇවිලෙන්නාහුය; උබ්භතං තාදිසමෙව හොති, නැගූ පියවරද එසේම වන්නේය; (හෙවත් තුබූපතුල සිවියපටත් ඇට දනහෙයින්ද නැගූපතුල ඇටපටන් සිවියදක්වා දනහෙයින්ද තුබූපතුලට කී ක්‍රමය වන්නේය) භික්ඛවෙ, මහණෙනි; යතොච ඛො, යම්හෙයකින්; සො, හෙතෙම; බහුසම්පත්තො හොති, අනෙකවර්ෂ සහස්‍රයෙන් ගොස් සම්ප්‍රාප්තවේද එකල්හි; තං ද්වාරං, ඒ දොර; පිථීයති, වැසෙන්නේය; සො, හෙ

හෙතෙම; තත්‍ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කාර්කශවූ; වෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳින්නේය; යාව, යම්තාක්කල්; තං පාපංකම්මං, ඒ පාපකර්මය; නව්‍යන්ති හොති, කෙළවර නොවේද; තාව, එතාක්කල්; නචකාලං කරෙති, කාලක්‍රියා නොකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; දීඝස්ස අද්ධුනො, අච්චයෙන, දීර්ඝකාලයක් ඇවෑමෙන්; කදාචි කරහචි, කිසිකලෙක්හි; තස්ස මහානිරයස්ස, ඒ මහානරකයාගේ; පච්ඡිමං ද්වාරං; පශ්චිමදොරටුව; අපාපුරීයති, ඇරෙන්නේය; හොති බො සො සමයො, මෙබඳුකලක් ඇත්තේය; සො, හෙතෙම; තත්‍ථ, එහි, සීඝෙන ජවෙන, සීඝ්‍රජවයෙන්; ධාවති, දුවන්නේය; සීඝෙන ජවෙන ධාවතො, සීඝ්‍රවූ ජවයෙන් දුවන්නාවූ; තස්ස, ඔහුගේ; ඡවිම්පි ඩය්හති, සමද දවන්නේය; මංසම්පි ඩය්හති, මස්ද දවන්නේය; නහාරුම්පි ඩය්හති, නහරද දවන්නේය; අට්ඨීනිපි සම්පධූපායන්ති, ඇටද ඇවිලෙන්නාහුය; උබ්භතං තාදිසමෙව හොති, නැගූ පියවරද එලෙසම වන්නේය (හෙවත් තුබූ පියවර ඇටදක්වා දවනහෙයින්ද නැගූපියවර ඇටපටන් සිව්යදක්වා දවනහෙයින්ද යටතුබූ පතුලට කී ක්‍රමය වන්නේය) භික්ඛවෙ, මහණෙනි; ය තොචබො, යම්හෙයකින්; සො, හෙතෙම, බහුසම්පත්තො, අනේක වර්ෂයෙන් ගොස් සම්ප්‍රාප්තවේද; අථ, එකල්හි; තං ද්වාරං, ඒ ද්වාරය; පිථීයති, පිහිතද වන්නේය; සො, හෙතෙම; තත්‍ථ එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කටුකවූ; දුක්ඛාවෙදනා, දුඃඛවෙදනාවන්; වෙදෙති, විඳින්නේය; යාව යම්තාක්කල්; තං පාපංකම්මං, ඒ පාපකර්මය; නව්‍යන්ති හොති, කෙළවරනොවේද, තාව, එතාක්කල්; නචකාලං කරෙති, කාලක්‍රියා නොකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; කදාචි කරහචි, කිසිකලෙක්හි; දීඝස්ස අද්ධුනො, අච්චයෙන. දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන්; තස්ස මහානිරයස්ස, ඒ අවීචිමහනරකයාගේ; උත්තරං ද්වාරං, උතුරුදොරටුව; අපාපුරීයති, විවෘතවන්නේය; හොති බො සමයො, එබඳු කාලක් ඇත්තේය; සො, හෙතෙම; තත්‍ථ, එහි; සීඝෙන ජවෙන ධාවති, සීඝ්‍රවූ ජවයෙන් දුවන්නේය; සීඝෙන ජවෙන ධාවතො, සීඝ්‍රවූ ජවයෙන් දුවන්නාවූ; තස්ස, ඔහුගේ; ඡවිම්පි ඩය්හති, ස යද දවන්නේය; චම්මම්පිඩය්හති, සමද දවන්නේය; මංසම්පිඩය්හති, මස්ද දවන්නේය; නහාරුම්පිඩය්හති, නහරද දවන්නේය; අට්ඨීනිපි සම්පධූපායන්ති, ඇටද ඇවිලෙන්නාහුය; උබ්භතංතාදිසමෙව හොති, නැගූපියවරදඑබඳුවන්නේය; භික්ඛවෙ, මහණෙනි; යතොච බො, යම්හෙයකින්; සො, හෙතෙම;

බහුසම්පන්නතා හොති, අනෙකවර්ෂයෙන් ගොස් සම්ප්‍රාප්ත
වේද; අථ, එකල්හි; තං වාරං, ඒ දොර; පිපීයති, වැහෙන්නේ
ය; සො, හෙතෙම; තත්ථ, එහි; තිප්පා, තිව්‍රවූ; කටුකා, කර්කශ
වූ; දුක්ඛාවෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳින්නේය;
යාව, යම්තාක්කල්; තං පාපං කම්මං, ඒ පාපකර්මය; නව්‍ය
න්ති හොති, කෙළවර නොවේද; තාව, එතාක්කල්; නච කා
ලං කරොති, කාලක්‍රියා නොකරන්නේය; භික්ඛවෙ, මහණෙ
නි, දීඝස්ස අද්ධුනො අච්චයෙන, දීඝකාලයක්හුගේ ඇවෑමෙ
න්; කදාචි කරහචි, කිසිකලෙකත්හි; තස්ස මහානිරයස්ස, ඒ අ
වීචිමහානරකයාගේ; දක්ඛිණං වාරං, දකුණුදොරටුව; අවාපුරී
යති, විවෘතවන්නේය; හොති ඛො සමයො, එබඳුකලක් ඇ
ත්තේය; සො, හෙතෙම; තත්ථ, එහි; සීඝෙන ජවෙන ධාවති,
සීඝ්‍රවූ ජවයෙන් දුවන්නේය; සීඝෙන ජවෙන ධාවතො, සීඝ්‍ර
ජවයෙන් දුවන්නාවූ; තස්ස, ඔහුගේ; ඡවිම්පි ඩය්හති, සිවියද
දවන්නේය චම්මම්පි ඩය්හති, සමද දවන්නේය; මංසම්පි ඩ
ය්හති, මස්ද දවන්නේය; නහාරුම්පි ඩය්හති, නහරද දවන්නේ
ය, අට්ඨීනිපි සම්පධූපායන්ති, ඇටද ඇවිලෙන්නාහුය; උබ්භතං
තාදිසමෙව හොති, නැගුප්පයවරද එබඳුවන්නේය; භික්ඛවෙ,
මහණෙනි; යතොච ඛො, යම්හෙයකින්; සො, හෙතෙම; බහු
සම්පන්නො හොති, අනෙකවර්ෂයෙන්ගොස් සම්ප්‍රාප්තවේද;
අථ, එකල්සි; තං වාරං, ඒ දොර; පිපීයති, වැසෙන්නේය;
සො, හෙතෙම; තත්ථ, එහි; තිප්පා, තිව්‍රවූ; කටුකා, කර්කශ
වූ; දුක්ඛාවෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳින්නේය;
යාව, යම්තාක්කල්; තං පාපංකම්මං, ඒ පාපකර්මය; නව්‍යන්ති
හොති, කෙළවරනොවේද; තාව, ඒතාක්කල්; නචකාලංක
රොති, කාලක්‍රියා නොකරන්නේය; භික්ඛවෙ, මහණෙනි;
තස්ස ඛො පන මහානිරයස්ස, ඒ අවීචිමහනරකයට; සමනන්ත
රාසන්න මෙව, අනතුරුවම පිහිටියාවූ; මහන්තො, සියක්යො
දුන කකියන මහත්වූ; ගූථනිරයො, ගූථනරකයෙක් වන්නේ
ය; සො, හෙතෙම; තත්ථ, එහි; පතති, (එක්පයක් ගූථනරක
යෙහි තබා එක්පයක් අවීචිමහනරකයෙහි තිබා)හෝතේය;
භික්ඛවෙ, මහණෙනි; තස්මිං ඛොපන ගූථනිරයෙ, ඒ ගූථ
නරකයෙහි; සූචිමුඛාපාණා, යකඩමුවඇති පණුවෝ; ඡවිං
ඡින්දන්ති, සිවිය සිඳින්නාහුය; ඡවිංඡෙත්වා, සිවිය සිඳ; චම්ම
ඡින්දන්ති, සම සිඳුන්නාහුය; චම්මං ඡෙත්වා, සම සිඳ; මංසංඡි
න්දන්ති, මස් සිඳින්නාහුය; මංසං ඡෙත්වා, මස් සිඳ; නහාරුං
ඡින්දන්ති, නහර සිඳින්නාහුය, නහාරුං ඡෙත්වා, නහර සිඳ;
අට්ඨිං ඡින්දන්ති, ඇට සිඳින්නාහුය අට්ඨිං ඡෙත්වා, ඇට සිඳ;

අට්ඨී මිඤ්ජං ඛාදන්ති, ඇටමිදුළු කන්නාහුය; සො, හෙතෙමේ;
තත්‍ථ, එහි; තිප්පා, තිව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛාවෙදනා,
දුක්ඛවෙදනාවන්; වෙදෙති. විඳින්නේය; යාව, යම්තාක්කල්;
තං පාපකම්මං, ඒ පාපකර්මය; නව්‍යන්ති හොති, කෙළවර
නොවේද; තාව, එතාක්කල්; නච කාලං කරොති, කාලක්‍රියා
නොකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; තස්ස බොපන ගූථ
නිරයස්ස, ඒ ගූථනරකයට; සමනන්තරාසහිතමෙව, අනතුරුව
පිහිටියාවූ; මහනෙතා කුක්කුළනිරයො, මහත්වූ (කූටාගාර ප්‍ර
මාණවූ අඟාරයෙන්පරිපූර්ණවූ ආදීප්තභස්මයෙන් ප්‍රච්ඡන්නවූ
සියක්යොදුන්) කුක්කුළනරකයක් වන්නේය සො, හෙතෙ
ම; තත්‍ථ, එහි; පතති, හෙන්නේය; සො, හෙතෙම; තත්‍ථ,
එහි; තිප්පා, තිව්‍රවූ; කටුකා, කර්කශවූ; දුක්ඛාවෙදනා, දුක්ඛ
වෙදනාවන්; වෙදෙති, විඳින්නේය; යාව, යම්තාක්කල්; තං
පාපංකම්මං, ඒ පාපකර්මය; නව්‍යන්ති හොති, කෙළවර
නොවේද; තාව, එතාක්කල්; නචකාලං කරොති, කාලක්‍රියා
නොකරන්නේය; භික්ඛවෙ, මහණෙනි, තස්ස, බොපනා කු
ක්කුළනිරයස්ස, ඒ කුක්කුළනරකයට; සමනන්තරාසහිතමෙව,
අනතුරුව පිහිටියාවූ; උබ්බං යොජනමුග්ගතං, යොදුන් උස
නැගාවූ; සොළසංගුලකණ්ටකං, සොළොස් අඟුල් යකටුඇ
ති, ආදිත්තං, ගිනිගෙණ ඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතං, ප්‍රකර්ෂ
යෙන් දිළිගෙන්නාවූ; සජොතිභූතං, ගිනිදැල් සහිතවූ; මහ
න්තං, මහත්වූ, සිම්බලිවණං, හිඹුල්වනයක් වන්නේය; සො,
හෙතෙම; තත්‍ථ, එහි, ආරොපෙන්ති, (පාර පන්සියයක් ගසා
බිමබලාසිටි කටුපෙළින්) ගසඋඩට නගන්නාහුය, ඔරොපෙ
න්ති, (පාර පන්සියයක් ගසා උඩබලාසිටි කටුපෙළින්) බිම
ට බාන්නාහුය;සො, හෙතෙම, තත්‍ථ, එහි, තිප්පා, තිව්‍රවූ, කටු
කා, කර්කශවූ, දුක්ඛාවෙදනා, දුක්ඛවෙදනාවන්, වෙදෙති, වි
ඳින්නේය, යාව, යම්තාක්කල්, තං පාපංකම්මං, ඒ පාපකර්ම
ය, නව්‍යන්ති හොති, කෙළවරනොවේද, තාව, එතාක්කල්
නචකාලං කරොති, කාලක්‍රියා නොකරන්නේය, භික්ඛවෙ,
මහණෙනි, තස්ස බොපන සිම්බලිවනස්ස, ඒ හිඹුල්වනයට, ස
මනන්තරාසහිතමෙව,අනතුරුව පිහිටියාවූ,මහන්තං,මහත්වූ;
අසිපත්තවනං, ( කඩුපතින් ගැවසීගත්තාවූ ) අසිපත්‍රවනයක්
වන්නේය, සො, හෙතෙම; පත්‍ථ, එහි; පවිසති, ප්‍රවිෂ්ටවන්නේ
ය; තත්‍ථ, එහි, වාතෙරිතානි පත්තානි, ඔහුගේ කර්මජවාතයෙ
න් වැටෙන්නාවූ පත්‍රයො, පතන්ති, ඔවුන්ගේ ඇඟ වැටෙ
න්නාහුය, තස්ස,ඔහුගේ, හත්‍ථම්පි ඡින්දන්ති, අත් සිඳින්නාහුය,

පාදම්පි ඡින්දන්ති, පා සිඳින්නාහුය, හත්ථපාදම්පි ඡින්දන්ති, හස්තපාද සිඳින්නාහුය, කණ්ණම්පි ඡින්දන්ති, කන් සිඳින්නාහුය, නාසම්පි ඡින්දන්ති, නාස සිඳින්නාහුය, කණ්ණනාසම්පි ඡින්දන්ති, කන් නාසා සිඳින්නාහුය, සො, හෙතෙම, තත්ථ, එහි, තිප්පා, තීව්‍රවූ, කටුකා, කක්කසවූ, දුක්ඛාවෙදනා, දුක්ඛවෙදනාවන්, වෙදෙති, විඳින්නේය, යාව යම්තාක්කල්, තං පාපංකම්මං, ඒ පාපකර්මය, නව්‍යන්ති හොති, කෙළවර නොවේද, තාව එතාක්කල්, නචකාලං කරොති, කාලක්‍රියා නොකරන්නේය, භික්ඛවෙ, මහණෙනි, තස්ස ඛොපන අසිපත්තවනස්ස, ඒ අසිපත්‍රවනයට වනාහී, සමනන්තරා සහිතමෙව, අනතුරුව පිහිටියාවූ, මහාඛාරෙදිකානදී, මහත්වූ, තාම්‍රලොහපරිපූර්ණවූ වෙතරණීනම් නරකයක් වන්නීය, සො, හෙතෙම, තත්ථ, එහි, පතති, හෙන්නේය, තත්ථ, එහි, අනුසොතම්පි වුය්හති, පලලට වැද (ක්ෂුරධාරාවෙන් කෑඩිකෑඩි බොහො කලක් ඌර්ධ්වයට නැඟී ඌර්ධ්වශ්‍රොතයට යන්නේය) තත්ථ, එහි පටිසොතම්පි වුය්හති, පතිශ්‍රොතයට යන්නේය, අනුසොතම්පි පටිසොතම්පි වුය්හති, (පොකුරුපතින් කඩනලදුව කරවැල්කැටියෙන් විදිනලදුව කුසතෘණයෙන් විදිනලදුව වෙතුලතාවෙන් අදිනලදුව) අනුශ්‍රොත පතිශ්‍රොතයට යන්නේය; සො, හෙතෙම; තත්ථ, එහි; තිප්පා, තීව්‍රවූ; කටුකා, කක්කසවූ; දුක්ඛා වෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳින්නේය; යාව, යම්තාක්කල්; තං පාපංකම්මං, ඒ පාපකර්මය; නව්‍යන්ති හොති, කෙළවර නොවේද; තාව ඒතාක්කල්; නච කාලං කරොති, කාලක්‍රියා නොකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙනං, නරකගත සත්වයා; බලිසෙන උද්ධරිත්වා, බිලියෙන් ගොඩනගා; ථලෙ පතිට්ඨපෙත්වා, භූමියෙහි සිටුවා; එවමාහංසු, මෙසේ කීවාහුය; අම්භොපුරිස, එම්බා භවත් පුරුෂය; කිං ඉච්ඡසීති; කුමක් රුචිදැයි විචාරන්නේය; සො, හෙතෙම; එවමාහ, මෙසේ කියන්නේය; භන්තෙ, වහන්ස; ජිඝච්ඡිතොස්මි, බඩසා ඇත්තෙමි කියන්නේය; භික්ඛවෙ, මහණෙනි, නිරයපාලා, යමපල්හු; අදිත්තෙන, ගිනිඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතෙන, ප්‍රකර්ෂයෙන් දිලියෙන්නාවූ; සජොතිභූතෙන, ගිනිදැල් ඇවිලෙන්නාවූ; තත්තෙන, රත්වූ; අයොසංකුනා, යකඩුවෙන්; මුඛං විවරිත්වා, මුඛය විවෘතකොට; ආදිත්තං, ගිනිඇවිලෙන්නාවූ; සම්පජ්ජලිතං, ප්‍රකර්ෂයෙන් දිලියෙන්නාවූ; සජොතිභූතං, ගිනිදැල්සහිතවූ; තත්තං, රත්වූ; ලොහගුලං, ලොහො

ගුලියක්; මුඛෙ පක්ඛිපන්ති, මුඛයෙහි ප්‍රක්‍ෂෙප කරන්නාහුය; තස්ස, ඔහුගේ; ඔට්ඨම්පිඩය්හති, තොලදදවන්නේය; මුඛම්පි ඩය්හති, මුඛයදදවන්නේය; කණ්ඨම්පිඩය්හති, උගුරදදවන් නේය; උරම්පිඩය්හති, ලයදදවන්නේය; අන්තම්පිඩය්හති, අතුනුදදවන්නේය; අන්තගුණම්පිආදාය, අතුණුබහන්දගෙණ; අධොභාගානික්ඛමති, අධොභාගයෙන් නික්මයන්නේය; සො, හෙතෙම; තත්‍ථ, එහි; තිප්පා; තිව්‍රවූ; කටුකා, කක්ක ෂවූ; දුක්ඛාවෙදනා, දුක්ඛවෙදනාවන්; වෙදෙති, විඳින්නේ ය; යාව, යම්තාක්කල්; නංපාපංකම්මං, ඒපාපකම්මය; නව්‍ය න්තිහොති, කෙලවරනොවේද; තාව, ඒතාක්කල්; නචකා ලංකරොති, කාලක්‍රියා නොකරන්නේය — භික්ඛවෙ, මහ ණෙනි; නිරයපාලා, නරකපාලයෝ; තමෙනං, නරකගත සත්‍වයාට; එවමාහංසු, මෙසේ කියන්නාහුය; අම්භොපුරිස, එම්බාපුරුෂය; කිං ඉච්ඡසීති, කුමක්රුච්දැයි විචාරන්නේය; සො, හෙතෙම; එවමාහ, මෙසේකියන්නේය; භන්තෙ, වහන් ස; පිපාසිතොසම්, පිපාසිතයෙමි කියන්නේය; භික්ඛවෙ, මහ ණෙනි; නිරයපාලා, යමපල්හු; ආදිත්තෙන, ගිනිඇවිලෙන් නාවූ; සම්පජ්ජලිතෙන, සම්ප්‍රජ්වලිතවූ; සජොතිභූතෙන, ජ්වා ලාසහිතවූ; තත්තෙන, ආදීප්තවූ; අයොසඞ්කුනා, යහඩුවෙ න්; මුඛංවිවරිත්වා, මුඛයවිවෘතකොට; ආදිත්තං, ආදීප්තවූ; ස ම්පජ්ජලිතං, සම්ප්‍රජ්වලිතවූ; සජොතිභූතං, ජ්වාලාසහිතවූ; තත්තං, යියිගෙණ දලියෙන්නාවූ; තම්බලොහං, තාම්‍රලො හොදක; මුඛෙආසිඤ්චන්ති, මුඛයෙහි වත්කරන්නාහුය; තස්ස, ඔහුගේ; ඔට්ඨම්පිඩය්හති, ඔෂ්ඨයද දවන්නේනේය, මුඛම්පි ඩය්හති, මුඛයද දවන්නේය; කණ්ඨම්පිඩය්හති, උගුරද දවන් නේය; අන්තම්පිඩය්හති, අතුණුද දවන්නේය;—අන්තගුණම්පි ආදාය, අතුණුබහන්ද ගෙණ; අධොභාගා නික්ඛමති, අධො භාගයෙන් නික්මෙන්නේය; සො, හෙතෙම, තත්‍ථ, එහි; ති ප්පා, තිව්‍රවූ; කටුකා, කක්කශවූ; දුක්ඛාවෙදනා, දුඃඛවෙදනාවන්, වෙදෙති, විඳින්නේය; යාව, යම්තාක්කල්; නංපාපංකම්මං, ඒ පාපකම්මය; නව්‍යන්තිහොති, ක්‍ෂයනොවේද; තාව, ඒතාක් කල්; නචකාලංකරොති, කාලක්‍රියානොකරන්නේය—භික්ඛ වෙ, මහණෙනි; තමෙනං, ඔහු; නිරයපාලා, යමපල්හු; පුන, නැවත; මහානිරයෙ, මහනරකයෙහි, පක්ඛිපන්ති, ප්‍රක්‍ෂෙ පකරන්නාහුය — (මෙසේ පංචවිධබන්ධනයෙහි පටන්ගෙ ණ තාම්‍රලොහපානයදක්වා අනුලොමයෙන්ද; තාම්‍රලොහ පානයෙහි පටන්ගෙණ පංචවිධබන්ධනයදක්වා ප්‍රතිලෝම

යෙන්ද; මහත්වූ නරකදුක් අනුභවකෙරෙති, ඇතම්කෙනෙ
ක් පංචවිධබන්ධනයෙන් මුක්තවෙති ඇතම්කෙනෙක් ඒති
යකම්මයෙන් මුක්තවෙති, ඇතම්කෙනෙක් තාම්‍රලෝහපා
ණයෙන් මුක්තවෙති; කම්මයන් ක්‍ෂයනුවූකල්හි යමපල්හු
ඔවුන්ගෙණ වැලිදු මහානරකයෙහි බහාපියත් — මේ දේ
වදූතසූත්‍රය දුහුනුකරණ ලදරුභික්‍ෂුකෙනෙක් ස්වාමිනි මෙ
තෙක්දුක් අනුභවකල සත්වයෝ නැවත නැවතත් මහාන
රකයෙහි ප්‍රක්‍ෂේපකරද්දැයි විචාලේය ඇවැත්නි එසේය පා
පය ක්‍ෂයනුවූකල්හි මෙලෙස කරණුණාහුයයි කීසේක ස්වා
මීනි මේ උද්දෙසයසිටුවා කම්මස්ථාන දුතමැතවැයිකියා ක
ම්මස්ථානගෙණගොස් කම්මස්ථාන මෙමෙණෙහිකොට සෝවා
න්මයිත්ගොස් නිවන්දැක නැවත උද්දෙස ගත්සේක — මේ
ප්‍රදෙශයෙහි සෙසුඇයත් උද්දෙසතබාගොස් කම්මස්ථානමෙ
ණෙහිකොට රහත්පූවන්ගේ ගණනනැත - සියළු බුදුවරයෝ
ම මේ දේවදූතසූත්‍රාන්ත ධම්මදෙශනාව නොහළසේක්මයයි
සලකා, මෙ ශාසනයෙහි ප්‍රාඥයන්විසින් අර්ථයත් ධම්මයත්
ඉගෙණ ඒවූ පරිඳුත් නිවන්දකින්ට උත්සාහකටයුතු.)

භික්ඛවෙ, මහණෙනි; භූතපුබ්බං, පෙරවූදෙයක්කියමි; ය
මස්සරඤ්ඤෝ, යමරජහට; එතදහොසි, මෙබඳුසිතක්වූයේය-
හො, ජිත්වන්නි;ලොකෙ, සත්වලෝකයෙහි; යෙකිර, යම්කෙ
නෙක්වනාහී; පාපානිකම්මානි කරෙන්ති, පව්කම්කෙරෙද්ද;
(හෙවත් බුදුන්ට අනමට වැරැද්දෝද, මව්පියන් සිල්වතුන් මැ
රුවෝද ජනපදපීඩාකල රජදරුවෝද කූටව්‍යවහාරිකයෝද
කූටසාක්‍ෂිනයෝද කූටවානිජයෝද දුස්සීලයෝද මිථ්‍යාජීවිය
ත්තෝද ගර්භපාතනයකල ස්ත්‍රීහුද පරදාර පරිග්‍රහකළෝද
සොරසැමියන්හා වැටුනෝද උරන් මුවන් මැරුවෝද පක්‍ෂි
වධකළෝද මිණිස්වධනළෝද පරද්‍රව්‍යගත්තෝද මිත්‍රද්‍රෝ
හිකළෝද සුරාසොඬයෝද පෛශුන්‍යවාදීහුද පරුෂවචනයෙ
න් වෘඬජනයන්ට තර්ජනකළෝද අහම චරදවාගත්තෝද ම
ත්සරයෝද සිල්නොරක්නෝදැයි යන)තෙ, ඔව්හු; එවරූපා,
මෙබඳුවූ; විවිධාකම්මකරණා කරියන්ති, නානාප්‍රකාරකම්කාවූ
එකරන්නාහුය; අහං, මම; මනුස්සත්තං ලභෙය්‍යං, දුර්ලභවූ
මනුෂ්‍යත්මභාවය ලැබීත්නම්; අරහං, (දිව්‍යබ්‍රහ්ම ගරුඩ ගා
න්ධර්ව සිද්ධ විද්‍යාධරාදීන්විසින් කරණුලබන ප්‍රත්‍යය ප්‍රතිපත්ති
පූජාවට සුදුසුහෙයින් ) අභ්‍යීත්වූ; සම්මාසම්බුද්ධො, සියල්ලද
න්හෙයින් සම්‍යක්සම්බුද්ධවූ; තථාගතො, තථාගතනාමද කා

රණයෙන් යුක්තවූ සර්වඥතෙම; ලොකෙ, ලොකයෙහි; උප්ප
ජ්ජෙය්‍ය, උපන්සේක්නම්; තංඅහං,ඒ මම; භගවන්තං, සර්වඥය
න්වහන්සේ; පයුරුපාසෙය්‍යං, පයුරුපාසනයකළෙම්නම්; අහං
ච, ඒමම; තස්සභගවතො, භාග්‍යවත්බුදුරජහුගේ; ධම්මංජා
නෙය්‍යං, ධර්මයදනිම්නම්; අහොවතාති, ඉතායහෙකැයි
සිත්විල්ලෙක් වන්නේය; අහංඛොපන, මමවනාහි; අඤ්ඤ
ස්ස සමණස්සවා, අනික්ශ්‍රමණයෙක්හුගෙන්හෝ; අඤ්ඤස්ස
බ්‍රාහ්මණස්සවා, අනික් බ්‍රාහ්මණයෙකුගෙන්හෝ; සුතං, අසා
නවදැමි, නොකියමි; භික්ඛවෙ, මහණෙනි; අපිච, එතකුදුළුව
ත්; යදෙව, යම්පමණ අටමහනරකයෙක් ඇද්ද; ඒසියල්ල;
සාමංඤාතං,තමාවිසින්ම ජානනයකරණලද්දේය;සාමංදිට්ඨං,
තමාවිසින්ම දිව්‍යඥාණයෙන් දක්නාලද්දේය;සාමංවිදිතං, පර
ප්‍රත්‍යයක්නැතිව තමාවිසින් ප්‍රකාශකරණලද්දේය; අහං, මම;
තංඑව, ඒවිදශීණාසියල්ල ප්‍රකාශකොට දෙසමියි වදාළසේක-
භගවා, ලොකාලොක දිවාකරවූ භාග්‍යවත් සර්වඥ රාජෝත්තම
යානන්වහන්සේ; ඉදං, මේ දේවදූතසූත්‍රාන්ත ධම්මදෙසනාව;
අවොච, ආෂාඪමාසයාගේ ප්‍රථමදිනයෙහි ගර්ජනාව පටන්
ගත් මහාමේඝයක්සේ අනල්පකොටි සතසහශ්‍රයෙහි කරණ
ලද කුසළයෙන් පහළවූ මුඛසුගන්ධයෙන් සියළු දම්සභාම
ණ්ඩපය සුවඳපිඩස්කෙරෙමින් මදුමදමුදිත ලලිත රතිකර
කුරවීකවිහිදුවා දෙශනාකර වදාළසේක—සුගතො, සොභන
ගුණ විශෙෂයක් පවත්නාහෙයින් සුගතනම්වූ සර්වඥරාජෝ
ත්තමයානන් වහන්සේ; ඉදංවත්වා, මෙසේ දෙශනාකර වදා
රා; අථ, නැවත; සත්ථා, සත්ථාසඞ්ඛයෙන් නිද්‍රිෂ්ටවූ බුදුරජානන්
වහන්සේ; අපරං, අන්‍යවූද කාරණයෙක්; එතදවොච, මෙ
සේප්‍රකාශකොට වදාළසේක—දෙවදූතෙහි, පංචදේවදූතය
න්විසින්;චොදිතා,කියනලද්දාවූ;යෙමානවා,යම්මනුෂ්‍යයෙක්;
පමජ්ජන්ති, කුසල්කිරීමෙහි පමාවෙද්ද; හීනකායූපගා, ලා
මකාත්මභාවයට ගියාවූ; තෙනරා, එසත්වයෝ; දීඝරත්තං,
දීර්ඝකාලයක් සොචන්ති, සෝකකරන්නාහුය; ඉධ, මේ ම
නුෂ්‍යලෝකයෙහි, ෂදෙවදූතෙහි, දේවදූතයන්විසින්; චොදි
තා, කියනලද්දාවූ; සන්තා, සන්හුන් සිත්ඇති; සප්පුරිසා, ස
ත්පුරුෂවූ; යෙච බො, යමෙක් ඇද්ද; ඒ සත්වයෝ; අරියධ
ම්මෙ, ආය්‍ය්‍යධර්මයෙහි; කුදාචනං, කිසිකලෙකත්; න, නොව
න්නාහුය; ජාතිමරණසම්භවෙ, ජාතිමරණයට කාරණාවූ; උපා
දානෙ, තෘෂ්ණාදෘෂ්ටිග්‍රහණය කිරීමෙහි; භයංදිස්වා, භයදැක;
අනුපාදාය, උපාදානයන්ගෙන් කිසිවක්නොගෙණ; ජාතිමර

ණ සඞ්ඛයෙ, ජාතිමරණ ක්‍ෂයකරන්නාවූ නිර්වාණයෙහි; වි මුච්චන්ති, අශේෂත් විමුක්තියෙන් මුක්තවන්නාහුයි—ඛෙමප්ප ත්තා, නිර්භය ප්‍රාප්තවූද; සුඛිනො, සුවපත්වූද; දිට්ඨධම්මාභි නිබ්බුතා, ඉහාත්මභාවයෙහි ක්ලේශධර්මයන් නිවූවාවූද; ස බ්බවෙර, සියළුවෛරීහුද; භයා, ක්ලේශභයද; අතීතා, දූරිකෘ තකළාවූද; තෙ, ඔවුහු; සබ්බදුක්ඛා, උපච්චගුන්ති, සියළුදුක් අතික්‍රාන්තකළාහම් වෙති වදැළුසේක—භගවා, (සධර්මචාරු භාව සාධකවූ භාග්‍යවත්) බුදුරජානන්වහන්සේ; ඉදං, මේ දේ වදූතසූත්‍රාන්ත ධර්මදෙශනාව; අවොච, කර්ණාමෘතකොට වදැළුසේක; අත්තමනා, සන්තොෂභාවයට පැමිණියාවූ; තෙ භික්ඛූ, ඒභික්ෂූහු; භගවතොභාසිතං, (අඛිලලෝක නායකවූ භාග්‍යවත්)බුදුරජානන් වහන්සේගේ වචනය; අභිනන්දුන්ති, සුලභය සුළුභයකියා මුදුනෙන් පිළිගත්තාහුය.

දේවදූතසූත්‍ර සන්නය නිමි.

---

## ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 4 | 8 | කාරෙනන්ත | කාරෙන්තො |
| 8 | 24 | ඉදමෙොච | ඉදමවොච |
| 9 | 16 | සර්වානාථ | සර්වනාථ |
| 10 | 6 | කීර්ත්ත | කීර්ති |
| 15 | 8 | වංකකිරි | වංකගිරි |
| 17 | 17 | ගණවයි | ගණුවයි |
| 21 | 28 | දෙරියනක් | දෙරියන් |
| 22 | 10 | කරවනන | කරවනනා |
| 22 | 17 | පලිසපරිවතත | පලිසපරිවත්ති |
| 24 | 13 | වැහෙණයහෙයික් | වැහෙණහෙයින් |
| 24 | 36 | පාපකර්ම | පාපකර්මය |

# දැන්වීමයි.

—○○—

මෙම මහාදේවදූත සූත්‍ර ධර්මදේශනාව "මජ්ඣිම නිකායෙහි" (මැදුම්සඟියෙහි) උපරිපණ්ණාසකයට අයත් සූත්‍රාන්තයකි, මෙය කායදුශ්චරිතාදියෙහි හැසිරීමෙන් වන්නාවූ දුක් ප්‍රකාශකොට සත්වයන් කායසුචරිතාදියෙහි හසුරුවාලීම පිණිස බොහෝ සේ නරකදුක්ම විස්තරකොට වදාරණලද්දකි-එබැවින් මෙහි යහපත් ධම්මකොට්ඨාසයක් අඩංගුව තිබෙන සෙයින් සියළු බෞද්ධයන් විසින්ම මෙය මනාකොට භාවිතා කිරීමෙන් සගමොක් සැප සිඛ කටයුතුයි.

මෙහි සමහරතැන් අටුවාවට නොසමලෙස තිබූන නමුත් බොහෝසේ සන්නවල තිබූන ලෙසම යෙදීමු.

මෙහි අපේ යම්කිසි ප්‍රමාද භ්‍රමාදියෙන් ජනිත දෝෂ ඇතත් එය ප්‍රාඥයෝ සොධනය කෙරෙත්වා.